**නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2020**

**-------------------------------------------------------------------------------------------**

නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය අතර 2017 ජුලි 07 දින එළඹි අංක එස්එල්-පී 116 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4 ඡේදයේ 6 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**--------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, වර්තමානයේ පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 04ක පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් මිනිසුන්ගේ ජීවන තත්ත්වයන් ඉහළ නැංවීම හා ජීවනෝපාය සංවර්ධනය කිරීම වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 20,622 කට සමාන ජපන් යෙන් මිලියන 15,409 ක් වන අතර ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් රු.මිලියන 17,185කට සමාන ජපන් යෙන් මිලියන 12,957ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,437කට සමාන ජපන් යෙන් මිලියන 2,452ක් මූල්‍යයනය කිරීමට ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජුලි 07 දින ආරම්භ කර තිබුණු අතර 2024 ජුලි 07 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

මාගේ වාර්තාවේ 2 වගුවේ දැක්වෙන කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ එකතුව රු.300,427,708ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද අත්තිකාරම් ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත්, ලෙජර් ගිණුම් අනුව එය රු. 268,355,136ක් ලෙස දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් රු.32,072,572කින් වැඩියෙන් දක්වා තිබුණි. | 32.07 | නිරීක්ෂණය සමග එකඟ වේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුවේ. |
| (ආ) | උපදේශන සේවාව සඳහා ගෙවන ලද අත්තිකාරම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.133,488,236ක් ලෙස දක්වා තිබුණි. කෙසේවෙතත්, අදාළ සටහන් අංක 09 හි එය රු. 115,877,554ක් ලෙස වැරදියට දක්වා තිබුණි. | 17.61 | නිරීක්ෂණය සමග එකඟ වේ. | මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සිවිල් කටයුතුවල පිරිවැය රු.946,464කින් වැඩියෙන් දක්වා තිබුණි. | 0.95 | නිරීක්ෂණය සමග එකඟ වේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුවේ. |
| (ඈ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරී ගෙන යන වැඩ සහ ජංගම වගකීම් ගිණුම්වලට රු. 302,588 ක මුදලක් වැරදි ලෙස ඇතුළත් කර තිබුණි. | 0.30 | නිරීක්ෂණය සමග එකඟ වේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුවේ. |
| (ඉ) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකක 04 මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් රු. මිලියන 119ක් මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ ලෙස ගෙන තිබුණි. කෙසේවෙතත්, ගණනය කිරීමට අනුව, මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. මිලියන 128ක් විය. මේ සම්බන්ධයෙන් රු. මිලියන 09ක වෙනස පැහැදිලි කර නොතිබුණි. | 8.70 | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකක ක්‍රම 02ක් අනුගමනය කර තිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකක මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිශ්චිත ක්‍රමයක් අනුගමනය කළ යුතුය. |
| (ඊ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන කටයුතු යටතේ කල්බදු පොළී ගෙවීම් රු.9,890,231ක් දක්වා තිබුණි. | 9.89 | නිරීක්ෂණය සමග එකඟ වේ. | මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව පිළියෙල කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | LKAS 07 සහ SLFRS 16 ට අනුව මූල්‍ය කටයුතු යටතේ දැක්විය යුතු කල්බදු වගකීමේ ප්‍රාග්ධන ගෙවීම රු.15,493,129ක් ආයෝජන කටයුතු යටතේ දක්වා තිබුණි. | 15.49 | නිරීක්ෂණය සමග එකඟ වේ. | මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව පිළියෙල කළ යුතුය. |
| (ඌ) | සිවිල් වැඩ සඳහා ගෙවන ලද රු. 546,906,655ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන කටයුතු යටතේ දක්වා තිබුණි. කෙසේවෙතත්, සිවිල් වැඩ මත ගෙවීමේදී අත්තිකාරම් මුදල් සහ ගෙවිය යුතු බිල්පත් මුදල් ගැලපීමේදී එකතුව රු. මිලියන 562,155,350 ගණනය කර තිබුණි. එම නිසා රු. 15,248,695ක් අඩුවෙන් දක්වා තිබුණි. | 15.25 | නිරීක්ෂණය සමග එකඟ වේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

**2.2 නොසැසඳුණු ශේෂ**

| ලෙජර් ගිණුම් | 2020 දෙසැම්බර් 31 දිනට මුදල | | අනුරූපී වාර්තාවල විස්තරය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | මූල්‍ය ප්‍රකාශන අනුව රු. මිලියන | අනුරූපී වාර්තා අනුව රු.මිලියන | | | |
| (අ) ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග සඳහා උපදේශකට කරන ලද අත්තිකාරම් | 77.85 | - | තහවුරු කිරීමේ ලිපි | උපදේශන සමාගම වෙත ශේෂය තහවුරු කිරීමේ ලිපි යවා ඇති බව දන්වා ඇත. | පොත්පත් සහ වාර්තා නිවැරදිව පවත්වා ගත යුතුය. |
| (ආ) පානීය ජලය සම්බන්ධ උපදේශක වෙත ගෙවන ලද අත්තිකාරම් | 38.03 | 33.80 | තහවුරු කිරීමේ ලිපි | තහවුරු කිරීමේ ලිපියෙහි දැක්වෙන මුදල නිවැරදි වේ. | පොත්පත් සහ වාර්තා නිවැරදිව පවත්වා ගත යුතුය. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 05 දිනැති අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.3.3 (ඇ) වගන්තිය | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව වැඩ බැලීමේ පදනම මත පත් කළ යුතු රජයේ ස්ථිර නිලධාරීන් දෙදෙනෙකු ව්‍යාපෘතියේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරු ලෙස | ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් 2021 ඔක්තෝබර් 31 දිනට හෝ පෙර ඉතිරි මුදල නිරවුල් කිරීමට නිලධාරීන්ට උපදෙස් දී තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව ගෙවන ලද වැටුප් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පත් කර තිබුණු අතර වැටුප් ලෙස රු.688,975ක් ගෙවා තිබුණි. | | |
| (ආ) | ඉහත චක්‍රලේඛයේ 4.3.1 වගන්තිය | අතිකාල රේටය ගණනය කිරීම සඳහා සියයට 50 ව්‍යාපෘති දීමනාව යොදා ගැනීම හේතුවෙන් අතිකාල රු.59,940ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවන ලද මුදල වාරික 03 කින් අයකර ගනු ලැබේ. | වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ඉහත චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් මාස 02කට වරක් පැවැත්විය යුතුවේ. කෙසේවෙතත්, සමාලෝචන වර්ෂය තුළදී රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීමට නොහැකි විය. | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීම අවශ්‍ය වේ. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | වාහන 10 ඉන්ධන පරිභෝජනය පිළිබඳව 2019 ඔක්තෝබර් පරීක්ෂණ කිරීමෙන් පසු 2021 අගෝස්තු 31 දින තෙක් නැවත පරීක්ෂා කර නොතිබුණි. | මෙම වර්ෂය අවසාන වීමට පෙර නිම කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් උපදෙස් ලබාදී ඇත. | ඉන්ධන භාවිතය පිළිබඳව නිසි පාලනයක් පවත්වා ගැනීමට පියවර ගත යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

-----------------------------

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

-----------------------------------------------

**3.1.1 සැලසුම්කරණ හා අධීක්ෂණ උපදේශකවරුන්ගේ කාර්යසාධනය**

------------------------------------------------------------------

| | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණන ගැටලුව | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | පානීය ජලය පිළිබඳ උපදේශන උප ව්‍යාපෘතියේ සැලසුම්කරණ කටයුතු 2020 ජූලි අවසාන වන විට නිම කළ යුතුවේ. කෙසේවෙතත්, උප උපදේශක ව්‍යාපෘති 25ක සියයට 48ක ප්‍රගතියක් පමණක් අත්කර ගෙන තිබුණි. | කොවිඩ් -19 වසංගත තත්ත්වය හා අනෙකුත් වළක්වා ගත නොහැකි සිද්ධීන් හේතුවෙන් වැඩ සැලැස්ම වෙනස් කර තිබුණි. | ගෙවීම් සිදු කිරීමට පෙර මාසික වැඩ ඇගයීමක් සිදු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | අදියර 02 යටතේ (පානීය ජලය) උප ව්‍යාපෘති 27 සැලසුම්කරණ කටයුතු 2021 ජනවාරි අවසාන වන විට නිම කළ යුතු වුවද, එක් ව්‍යාපෘතියක් පමණක් 2021 ජනවාරි 31 දිනට අවසන් කර තිබුණි. | කොවිඩ් -19 වසංගත තත්ත්වය හා අනෙකුත් වළක්වා ගත නොහැකි සිද්ධීන් හේතුවෙන් වැඩ සැලැස්ම වෙනස් කර තිබුණි. | ගෙවීම් සිදු කිරීමට පෙර මාසික වැඩ ඇගයීමක් සිදු කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග සඳහා අත්සන් කරන ලද ගිවිසුමට අනුව, 2020 දෙසැම්බර් මසට පෙර අදියර 01 යටතේ උප ව්‍යාපෘති 112ක් ආරම්භ කළ යුතු අතර, උප ව්‍යාපෘති 110ක විස්තරාත්මක සැලැස්ම සහ ලංසු ලියවිලි සකස් කිරීමේ කටයුතු නිම කළ යුතුය. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට පිළිවෙළින් උප ව්‍යාපෘති 41ක සහ උප ව්‍යාපෘති 29ක කටයුතු පමණක් නිමකර තිබුණි. | කොවිඩ් -19 වසංගත තත්ත්වය හා අනෙකුත් වළක්වා ගත නොහැකි සිද්ධීන් හේතුවෙන් වැඩ සැලැස්ම වෙනස් කර තිබුණි. | ගෙවීම් සිදු කිරීමට පෙර මාසික වැඩ ඇගයීමක් සිදු කිරීමට පියවර ගත යුතුය. |

**3.1.2 උප ව්‍යාපෘතිවල කාර්යසාධනය**

----------------------------------------

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘති සංදේශය සමග අමුණා ඇති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, 2021 පෙබරවාරි වන විට උප ව්‍යාපෘති 418ක ඉදිකිරීම් කටයුතු නිම කළ යුතුවේ. කෙසේවෙතත්, රුගෙන යා හැකි ජලය සම්බන්ධ ව්‍යාපෘති 11ක, ග්‍රාමීය මාර්ග උප ව්‍යාපෘති 37ක සහ වාරිමාර්ග ජල සැපයුම් ව්‍යාපෘති 12ක ඉදිකිරීම් කටයුතු 2021 ජුනි 30 දිනට ආරම්භ කර තිබුණි. | කොවිඩ් -19 වසංගත තත්ත්වය හා අනෙකුත් වළක්වා ගත නොහැකි සිද්ධීන් හේතුවෙන් වැඩ සැලැස්ම වෙනස් කර තිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| 2020 ජුනි 30 දක්වා උපදේශන කටයුතු සඳහා එකඟ වූ කාර්ය මණ්ඩලය යොදවා තිබුණි. | නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | කඩිනමින් එකඟ වූ කාර්ය මණ්ඩලය යෙදවීමට අවශ්‍ය වේ. |

**3.3 මතභේදයට තුඩු දෙන ගැටලු**

-------------------------------

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | එකවර ගෙවීමක් ලෙස රක්ෂණ වියදම් මත කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියන 9.48ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි. | ලංසු ඉදිරිපත් කිරීමේදී රක්ෂණය සඳහා වෙන් කිරීම එකවර ගෙවීමක් ලෙස සලකා ඇත. | වැඩිපුර කරන ලද ගෙවීම අයකර ගැනීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ඌව පළාතේ ඉලුක්තැන්න මඩුගොල්ල මාර්ග අලුත්වැඩියාව සඳහා කොන්ත්‍රාත්තුව නැවත ලංසු කැඳවීමේ ක්‍රමවේදයකින් තොරව ඇස්තමේන්තුගත පිරිවැයට වඩා වැඩියෙන් රු.මිලියන 133.30ක පිරිවැයකට පිරිනමා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියට රු. මිලියන 21.89ක පාඩුවක් දැරීමට සිදු වී ඇත. | නැවත ලංසු කැඳවීමේ ක්‍රමය අනුගමනය කරන විට ප්‍රතිලාභීන් වෙත ලැබෙන ප්‍රතිලාභවල ප්‍රමාදවීමක් සිදුවේ. | අදාළ ආයතන විසින් පිරිවැය අවම කර ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතියට කළමනාකරණ සහකාර ලෙස පත් කරන ලද නිලධාරියා 2017 පත්වීම් දින සිට අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ (ව්‍යාපෘති) පෞද්ගලික සහකාර ලෙස අනුයුක්ත කර තිබුණි. ව්‍යාපෘතිය මගින් ඉහත සඳහන් කළමනාකරණ සහකරු වෙත එකතුව රු. 1,554,046ක් ගෙවා තිබුණි. | JICA ව්‍යාපෘති සම්බන්ධ පළපුරුද්දක් සහිත, අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරියා කළමනාකරණ සහකරුවකු වෙනුවට ව්‍යාපෘතියට අනුයුක්ත කර ඇත. | පත්වීම් ක්‍රමවත් කිරීමට පියවර ගත යුතුය. |

## 3.5 පද්ධති හා පාලනයන්

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් ව්‍යාපෘතියේ ව්‍යාපෘති සංදේශයේ ඇමුණුම 16 සඳහන් උප ව්‍යාපෘති සඳහා අපේක්ෂිත මූල්‍යයන හා භෞතික ඉලක්ක ඇතුළත් කර විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මේ අදාළ පිටුවල පිටපතක් ඉදිරිපත් කර ඇත. | උප ව්‍යාපෘති සඳහා අපේක්ෂිත මූල්‍ය හා භෞතික ඉලක්ක ඇතුළත් කරමින් ව්‍යාපෘතිය විසින් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. |